ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1998 අංක 54 දරන නඩත්තු හිමිකම් පැමි (අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියාත්මක කිරීම) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 නොවැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 10.25 යි. තැපැල් ගාස්තුව : රු. 5.25 යි.

# 1998 අංක 54 දරන නඩත්තු හිමිකම් පෑම් (අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාත්මක කිරීම) පනත

[සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 27 වන දින.]

එල්.ඩී.–ඕ. 34/83.

**1956 ජුනි මස 20 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද විදේශවල දී නඩත්තු අයකර ගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය බලාත්මක කිරීම පිණිස ද, ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තන් විසින් හෝ ඒ තැනැත්තන්ගෙන් වෙනත් රටවල සිටින තැනැත්තන්ගෙන් හෝ ඒ තැනැත්තන් විසින් නඩත්තු අයකර ගැනීම පහසු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ශ්‍රී ලංකාවෙන් බැහැර තැනැත්තන් විසින් හෝ ඒ තැනැත්තන්ට විරුද්ධව ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත්‍ර විභාග කළ හැකිවන පරිදි මහෙස්ත්‍රාත් අධිකරණවල අධිකරණ බලය දීර්ඝ කිරීම හා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

ශ්‍රී ලංකාව, 1956 ජුනි මස 20 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද, විදේශවල දී නඩත්තු අයකර ගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ගිවිස්නා රටක් වන හෙයින් ද ;

ශ්‍රී ලංකාව 1958 අගෝස්තු මස 7 වන දින ඉහත කී සම්මුතිය ස්ථිර කළ හෙයින් ද ;

එකී සම්මුතිය ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාමය විධිවිධාන සැලැස්වීම අවශ්‍ය හා සුදුසු වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 1998 අංක 54 දරන නඩත්තු හිමිකම් පෑම් (අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාත්මක කිරීම) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1956 ජුනි මස 20 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද විදේශවල දී නඩත්තු අය කර ගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ශ්‍රී ලංකාව විසින් ස්ථිර කරන ලද දිනය වූ 1958 අගෝස්තු මස 7 වන දින ක්‍රියාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

පනත අදාළ කර ගැනීම.

2. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්—

(අ) ඒ නියමයේ නිශ්චිතව සඳහන් සෑම රටකට ම—

(i) ඒ රට නඩත්තු සම්මුතිය අදාළ රටක් වන අවස්ථාවක ; හෝ

(ii) මේ පනතේ විධිවිධාන අදාළ වීම, ඒ රටට ව්‍යාප්ත කෙරෙන ගිවිසුමකට ශ්‍රී ලංකාව සහ ඒ රට එළඹ ඇති අවස්ථාවක

මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු බවට; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන, චීන මහජන සමූහාණ්ඩුවේ හොංකොං විශේෂ පරිපාලන ප්‍රදේශයට ව්‍යාප්ත කෙරෙන ගිවිසුමකට ශ්‍රී ලංකාව සහ ඒ විශේෂ පරිපාලන ප්‍රදේශය එළඹ ඇති අවස්ථාවක, ඒ පරිපාලන ප්‍රදේශයට මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු බවට

ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද රටක් හෝ විශේෂ පරිපාලන ප්‍රදේශය මෙහි මින් මතු "නිශ්චිත රටක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ තැනැත්තකු විසින්, සම්මුති රටක දී නඩත්තු අයකර ගැනීම සඳහා හෝ සම්මුති රටක දී කරන ලද නඩත්තු නියෝගයක් බලාත්මක කිරීම හෝ වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

**3.** (1) (මේ වගන්තියේ මින් මතු "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ තැනැත්තකු විසින් (මෙහි මින් මතු "වගඋත්තරකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් තැනැත්තකුගෙන් නිශ්චිත රටක දී නඩත්තු අයකර ගැනීමට හිමිකම් ඇති බව කියා සිටින්නා වූ ද වගඋත්තරකරු තත්කාලයේ ඒ නිශ්චිත රටේ අධිකරණ බලයට යටත්ව සිටින්නා වූ ද අවස්ථාවක, ඉල්ලුම්කරු විසින් වගඋත්තරකරුගෙන් නඩත්තු අයකර ගැනීමේ ඉල්ලීම ඒ සම්මුති රටට යැවීම සඳහා (මෙහි මින් මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඉල්ලුම් කළ හැකි ය.

(2) වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුට නඩත්තු ගෙවීම සඳහා නිශ්චිත රටක දී කරන ලද ආඥාවක් ඉල්ලුම්කරුට—

(අ) බලාත්මක කරවා ගැනීමට ; හෝ

(ආ) වෙනස් කරවා ගැනීමට

වුවමනා වී ඇත්තා වූ ද වගඋත්තරකරු තත්කාලයේ ඒ රටේ පදිංචිව සිටින්නා වූ ද අවස්ථාවක ඉල්ලුම්කරු විසින් අවස්ථාවෝචිත පරිදි, එම ආඥාව බලාත්මක කරවා ගැනීම හෝ වෙනස් කරවා ගැනීම සඳහා වූ තමාගේ ඉල්ලීම ඒ රටට යැවීම සඳහා ලේකම්වරයා වෙත මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඉල්ලුම් කළ හැකි ය.

(3) අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ හෝ ඉල්ලීමක් ලැබුණු විට, ලේකම්වරයා විසින් ඒ ඉල්ලුම් පත්‍රය එයට යා කර ඇති යම් ලේඛන ද සමග, නිශ්චිත රටෙහි නිසි බලධරයා වෙත යැවිය යුතු ය.

නිශ්චිත රටවල සිටින තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව තුළ නඩත්තු අය කර ගැනීම සඳහා ඉල්ලුම් කිරීම.

4. (1) නිශ්චිත රටක තැනැත්තකු විසින් තත්කාලයේ ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින වෙනත් තැනැත්තකුගෙන් නඩත්තු අයකර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ඒ රටේ උචිත බලධරයාගෙන් ලේකම්වරයාට ලැබුණු විට ඔහු විසින් එම ඉල්ලුම් පත්‍රය, ඒ සමග එවන ලද යම් ලේඛන වේ නම් ඒවා ද සමග, ඒ වෙනත් තැනැත්තා පදිංචිව සිටින්නේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය තුළ ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(2) ඉල්ලුම් පත්‍රය විභාග කිරීමට අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙසට වූ සිතාසිය වෙනත් තැනැත්තාට නිසි ලෙස භාර දිය නොහැකි නම්, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් (3) වන උපවගන්තියට යටත්ව, ඒ ඉල්ලුම් පත්‍රය සහ ඒ සමග එවන ලද ලේඛන වෙනත් තැනැත්තා ඒ අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශය තුළ පදිංචිව නොමැති බවටත්, වෙනත් තැනැත්තා සිටින තැනක් නොදන්නා බවටත් වූ ප්‍රකාශයක් සමග ලේකම්වරයාට ආපසු යැවිය යුතු ය. එවිට ලේකම්වරයා විසින් ඉල්ලුම් පත්‍රය සහ ඒ සමග එවන ලද ලේඛන නිශ්චිත රටෙහි උචිත බලධරයා වෙත ආපසු යැවිය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ඉල්ලුම් පත්‍රය යවනු ලැබූ මහෙස්ත්‍රාත් අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයා, වෙනත් තැනැත්තා ශ්‍රී ලංකාව තුළ වෙනත් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය තුළ පදිංචිව සිටින බවට සෑහීමට පත්වුවහොත්, ඔහු ඒ ඉල්ලුම් පත්‍රය සහ ඒ සමග එවන ලද ලේඛන ඒ කාරණය ගැන ලේකම්වරයාට දන්වමින් ලේකම්වරයා වෙත යැවිය යුතු අතර, ලේකම්වරයා විසින් ඒ ඉල්ලුම් පත්‍රය සහ ඒ සමග එවන ලද ලේඛන, ඒ වෙනත් මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රය යවනු ලැබූ මහෙස්ත්‍රාත් අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයා, එය ඔහුට (1) වන උපවගන්තිය යටතේ යවනු ලැබූ විටක මෙන් කටයුතු කළ යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ—

(අ) ඉල්ලුම් පත්‍රයක් නඩත්තු ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් සඳහා වූ ඉල්ලීමක් ලෙස සැලකිය යුතු අතර, ඒ ඉල්ලීම සහ එය ප්‍රකාර කරන ලද යම් නියමයකට, ඒ ආඥාපනතේ 3, 4 සහ 5 වන වගන්ති අදාළ විය යුතු ය ; තවද

(ආ) ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු පෞද්ගලිකව අධිකරණය ඉදිරියේ පැමිණ සිටියාක් සේ සලකා කටයුතු කර ගෙන යා යුතු ය.

(6) ඒ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ආඥාවක් කළ විටක, රෙජිස්ට්‍රාර්වරයා, තත් කාර්යය සඳහා පවත්වා ගත යුතු රෙජිස්ටරයක ඒ ආඥාව ලේඛනගත කළ යුතු ය.

(7) ලේඛනගත ආඥාවක් යටතේ අයවිය යුතු යම් මුදලක් ගෙවීම, ආඥාව මහෙස්ත්‍රාත් අධිකරණයක ලේඛනගත කර තිබෙන අතරතුර, මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් කළ යුතු අතර, නඩත්තු ආඥාපනතේ 8අ සහ 8ආ වගන්ති ඒ ලේඛනගත ආඥාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

සම්මුති රටක දී කරන ලද ආඥාවක් බලාත්මක කිරීම.

5. (1) නිශ්චිත රටක සිටින තැනැත්තකු විසින්, තත්කාලීනව ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින තැනැත්තකුගෙන්, ඒ රටෙහි අධිකරණයක් විසින් කරන ලද යම් ආඥාවක් ප්‍රකාර නඩත්තු අය කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක්, ඒ රටෙහි නිසි බලධරයාගෙන් ලේකම්වරයා වෙත ලැබුණු අවස්ථාවක, ඔහු විසින් ඒ ඉල්ලුම් පත්‍රය බලාත්මක කරවා ගැනීමට අදහස් කරන සහ ආඥාවේ සහතික කළ පිටපතක් ඒ සමග එවන ලද වෙනත් යම් ලේඛන ද සමග, ඒ ආඥාව යටතේ ගෙවීම කිරීමට යටත් තැනැත්තා පදිංචිව සිටින්නේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක බල ප්‍රදේශය ඇතුළත ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ඒ ආඥාව, තත් කාර්යය සඳහා පවත්වා ගත යුතු රෙජිස්ටරයක ලේඛනගත කිරීම සහ ඉන් අනතුරුව එසේ ලේඛනගත කළ ආඥාවේ පිටපතක්, ඒ ආඥාව යටතේ ගෙවීම් කිරීමට යටත් තැනැත්තා වෙත භාර දීම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් යවනු ලැබූ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා එම බලාත්මක කරවා ගැනීමට අදහස් කරන ලද ආඥාව යටතේ ගෙවීම් කිරීමට යටත් තැනැත්තා–

(අ) ශ්‍රී ලංකාවේ වෙනත් යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටින බවට සෑහීමට පත් වූ අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම් පත්‍රය, ආඥාවේ සහතික කළ පිටපත සහ ඒ සමග එවන ලද අනෙකුත් සියලු ලේඛන, ඒ කාරණය ගැන දන්වමින් ලේකම්වරයා වෙත ආපසු යැවිය යුතු අතර, ලේකම්වරයා විසින් ඒ ඉල්ලුම් පත්‍රය, ආඥාවේ සහතික කළ පිටපත සහ ඒ සමග එවන ලද අනෙකුත් සියලු ලේඛන, ඒ වෙනත් මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(ආ) ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශය ඇතුළත පදිංචිව නොමැති බවට සහ ඒ තැනැත්තා සිටිනා තැනක් නොදන්නා බවට සෑහීමට පත් වූ අවස්ථාවක ඒ ඉල්ලුම් පත්‍රය, ආඥාවේ සහතික කළ පිටපත සහ ඒ සමග එවන ලද වෙනත් සියලු ලේඛන ලේකම්වරයා වෙත යැවිය යුතු අතර, ලේකම්වරයා විසින් ඉල්ලුම් පත්‍රය එවනු ලැබූ නිශ්චිත රට වෙත ඒවා ආපසු යැවිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ලේඛනගත කරන ලද ආඥාවක් යටතේ අයවිය යුතු යම් මුදලක් ගෙවීම, ඒ ආඥාව මහෙස්ත්‍රාත් අධිකරණයක ලේඛනගත කර තිබෙන අතරතුර, මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට කළ යුතු අතර, නඩත්තු ආඥා පනතේ 8අ සහ 8ආ වගන්ති ඒ ලේඛනගත ආඥාවක් හා සම්බන්ධයෙන්, අදාළ නොවිය යුතු ය.

6. මේ පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයකට ලැබුණු ඉල්ලුම් පත්‍රයක්, අවජාත දරුවකු සම්බන්ධයෙන් වූ අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය අදාළ වන දරුවා ඉපදීමෙන් ඉක්බිතිව වූ මාස දොළහ ඇතුළත ශ්‍රී ලංකාවෙන් බාහිර අධිකරණයක් විසින් අදාළ කරගත් නීතියේ නියමයන් අනුව ඒ දරුවාගේ නඩත්තුව සඳහා නඩත්තු අයකර ගැනීමට අදහස් කරන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින් මුදල් ගෙවා ඇති බව නඩත්තු ආඥාපනතේ 6 වන වගන්තියේ කාර්යය සඳහා ඔප්පු කිරීම ප්‍රමාණවත් වේ. අවජාත දරුවකු සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍රය.

## ලේඛනගත ආඥා මාරු කිරීම, බලාත්මක කිරීම, වෙනස් කිරීම හා ප්‍රත්‍යාදිෂ්ට කිරීම

ආඥා මාරු කිරීම.

7. (1) ලේඛනගත ආඥාවක් යටතේ වූ ගෙවන්නා ස්වකීය අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශය තුළ පදිංචිව සිටීම නතර වී ඇති බව ලේඛනගත කරන අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන අවස්ථාවක, ගෙවන්නා ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටීම නතර වී ඇති බව ඔහුගේ මතය වන්නේ නම් මිස, ඔහු විසින් (2) වන උපවගන්තියට යටත්ව, ආඥාවේ සහතික පිටපතක් සහ සම්බන්ධිත ලේඛන ලේකම්වරයාට යැවිය යුතු ය.

(2) ගෙවන්නා ශ්‍රී ලංකාව තුළ වෙනත් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය තුළ පදිංචිව සිටින බව ලේඛනගත කරන අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරන අවස්ථාවක, ඔහු විසින් ඒ කාරණාව ගැන ලේකම්වරයාට දන්වමින් ආඥාව ලේකම්වරයා වෙත මාරු කළ යුතු අතර, ලේකම්වරයා විසින් ඒ ලේඛන අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත මාරු කළ යුතු ය. (3) වන උපවගන්තියට යටත්ව, ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, තත් කාර්යය සඳහා පවත්වා ගත යුතු රෙජිස්ටරයක ඒ ආඥාව ලේඛනගත කළ යුතු අතර, ඒ ආඥාවේ පිටපතක්, ගෙවන්නා වෙත භාර කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.

(3) ඉහත (2) වන උපවගන්තිය අනුව ආඥාවක් ලේඛනගත කිරීමට ප්‍රථම ආඥාව යටතේ වූ ගෙවන්නා තම අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශය තුළ පදිංචිව සිටීදැයි නිශ්චය වශයෙන් දැන ගැනීම සඳහා ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු යැයි සලකනු ලබන පියවර ගත යුතු අතර, ගෙවන්නා එසේ පදිංචිව නොසිටින බවට එසේ පියවර ගැනීමෙන් පසුව සෑහීමට පත් වුවහොත් ඔහු විසින් ආඥාවේ සහතික පිටපත ද සම්බන්ධිත ලේඛන ද ලේකම්වරයා වෙත ආපසු යැවිය යුතු ය.

(4) ගෙවන්නා ශ්‍රී ලංකාවේ පදිංචිව සිටීම නතර වී ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරන ලද දැන්වීමක් සමග, ආඥාවක සහතික කළ පිටපතක් මේ වගන්තිය යටතේ ලේකම්වරයාට ලැබුණු අවස්ථාවක, ආඥාවේ පිටපත සහ සම්බන්ධිත ලේඛන, නිශ්චිත රටෙහි උචිත බලධරයා වෙත ලේකම්වරයා විසින් ආපසු යවනු ලැබිය යුතු ය.

8. (1) ආඥාව කළ අධිකරණය හැර වෙනත් අධිකරණයක් විසින් ලේඛනගත කරන ලද ලේඛනගත ආඥාවක්, එය ලේඛනගත කළ අධිකරණය විසින් කරන ලද ආඥාවක්, වූ කලක මෙන් ද එම අධිකරණයට එම ආඥාව කිරීමට අධිකරණ බලය තිබූ ලෙස ද බලාත්මක කරනු ලැබිය හැකි ය. එවැනි යම් ආඥාවක් බලාත්මක කිරීම සඳහා වූ හෝ ඒ සම්බන්ධයෙන් වූ නඩු කටයුතු මේ උපවගන්තිය අනුව පවත්වාගෙන යා යුතු අතර අන්‍යාකාරයකින් නොපැවැත්විය යුතු ය. ආඥා බලාත්මක කිරීම.

(2) මේ පනත යටතේ ආඥාවක් ලේඛනගත කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක ද ඒ අධිකරණය විසින් සහ එහි නිලධරයන් විසින් ඒ ආඥාව බලාත්මක කිරීම සඳහා සියලු පියවර ගත යුතු ය.

9. (1) ලේඛනගත ආඥාවක් වෙනස් කිරීම සඳහා නිශ්චිත රටක තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක්, ඒ රටේ උචිත බලධරයාගෙන් ලේකම්වරයා වෙත ලැබුණු විට, ඒ ඉල්ලුම් පත්‍රය, ඒ සමග එවන ලද යම් ලේඛන සමග, ලේඛනගත කරන අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය. ලේඛනගත ආඥාවක් වෙනස් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත එවන ඉල්ලුම් පත්‍රයක්, ඒ ඉල්ලුම් පත්‍රය අදාළ ආඥාව වෙනස් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ලෙස, ලේඛනගත කරන අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලුම් පත්‍රය විභාග කරන අධිකරණය විසින් ඒ ඉල්ලුම් කරුවන් අධිකරණය ඉදිරියේ සිටින්නාක් සේ නඩු කටයුතු කරගෙන යා යුතු ය.

10. (1) ලේඛනගත ආඥාවක්, ඒ ආඥාව කළ අධිකරණය හැර වෙනත් අධිකරණයක ලේඛනගත කරනු ලැබූ අවස්ථාවක, ඒ ආඥාව ඒ ලේඛනගත කළ අධිකරණය විසින් කරනු ලැබුවාක් සේ සහ ඒ ආඥාව කිරීමට ඒ අධිකරණයට අධිකරණ බලය ඇත්තාක් සේ, ඒ ලේඛනගත කළ අධිකරණයට, එය වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ සඳහා බලය ඇත්තේ ය. ලේඛනගත කරන අධිකරණය විසින් කරනු නොලැබූ ආඥාවක් වෙනස් කිරීමේ බලය.

(2) ලේඛනගත කරන අධිකරණයක් විසින්, ලේඛනගත ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක, ඒ අධිකරණය විසින් ඒ ආඥාවේ ලේඛනගත කිරීම, අවලංගු කළ යුතු ය.

(3) ලේඛනගත ආඥාවක් වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක වගඋත්තරකරු, ඒ ඉල්ලුම් පත්‍රය විභාග කිරීම සඳහා නියම කරනු ලැබ ඇති වේලාවට හා ස්ථානයේ පෙනී නොසිටි, එහෙත්—

(අ) වගඋත්තරකරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන බවට: සහ

(ආ) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම පිළිබඳව ද ඉහත කී වේලාව හා ස්ථානය පිළිබඳව ද ප්‍රමාණවත් දැනුම් දීමක් වගඋත්තරකරු කර ඇති බවට

අධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක, අධිකරණය විසින්, ඒ ඉල්ලුම් පත්‍රය විභාග කිරීම සඳහා නියම කරනු ලැබ ඇති වේලාවේ දී හා ස්ථානයේ දී නැතහොත් එම විභාගය අඩාළව කල් තබනු ලැබූ යම් වේලාවක දී හා ස්ථානයක දී වගඋත්තරකරු පැමිණ පෙනී සිටියාක් මෙන්, ඒ ආකාරයෙන් ඒ ඉල්ලුම් පත්‍රය විභාග කොට විනිශ්චය කිරීමට අධිකරණය විසින් කටයුතු කරගෙන යා යුතු ය.

(4) වෙනත් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් කරන ලද ලේඛනගත ආඥාවක් වෙනස් කරන හෝ ප්‍රත්‍යාදිෂ්ට කරන ආඥාවක් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් කරනු ලැබූ අවස්ථාවක හෝ එසේ වෙනස් කරන හෝ ප්‍රත්‍යාදිෂ්ට කරන ආඥාවක් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක හෝ එකී ලේඛනගත ආඥාව ඒ දෙවනුව සඳහන් අධිකරණය විසින් කරන ලද්දක් මෙන්, ඒ ආඥාවට හෝ එසේ ආඥාවක් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ විරුද්ධව අභියාචනය කිරීමේ අයිතිය, එයින් අතෘප්තියට පත් තැනැත්තකුට ඇත්තේ ය.

නිශ්චිත රටක දී දෙන ලද සාක්ෂිවල ආවේශ්‍යතාවය.

11. (1) (අ) නිශ්චිත රටක අධිකරණයක නඩු කටයුත්තක දී දෙන ලද සාක්ෂි දක්වන බවට හෝ සම්පිණ්ඩනය කර දක්වන බවට අදහස් කරන ලද සහ නිසි ලෙස සත්‍යායනය කරන ලද ලේඛනයක අඩංගු ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක වූ නඩු කටයුත්තක කාර්ය සඳහා එවැනි රටක දී, ඒ අධිකරණය වෙනුවෙන් කරන ලද ඉල්ලීමක් අනුව වුව ද නොඑසේව වුව ද ලබා ගන්නා ලද සාක්ෂි දක්වන බවට හෝ සම්පිණ්ඩනය කර දක්වන බවට අදහස් කරන ලද සහ නිසි ලෙස සත්‍යායනය කරන ලද ලේඛනයක අඩංගු ; හෝ

(ඇ) එවැනි රටක අධිකරණයක නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් භාර ගන්නා ලද බවට අදහස් කරන ලද සහ නිසි ලෙස සත්‍යායනය කරන ලද ලේඛනයක හෝ එසේ භාර ගන්නා ලදැයි අදහස් කරන ලේඛනයක පිටපතක් යැයි අදහස් කරන ලද ලේඛනයක අඩංගු

ප්‍රකාශයක්, මේ පනත යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයට යවන ලද ඉල්ලුම් පත්‍රයක් අනුව ඒ අධිකරණයේ දී ඇති වන යම් නඩු කටයුත්තක දී, ඒ ලේඛනයේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන්, ඒ නඩු කටයුත්තක දී ඒ කාරණය සම්බන්ධයෙන් වාචික සාක්ෂි ආවේශ්‍යවන ප්‍රමාණයට ම, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය.

(2) (1) (අ) උපවගන්තියේ සඳහන් පරිදි දෙන ලද හෝ (1) (ආ) උපවගන්තියේ සඳහන් පරිදි ලබා ගන්නා ලද සාක්ෂි දක්වන බවට හෝ සම්පිණ්ඩනය කර දක්වන බවට අදහස් කරන ලද ලේඛනයක්, ඒ ලේඛනය අවස්ථාවෝචිත පරිදි ඒ සාක්ෂි දෙන ලද්දේ යම් විනිශ්චයකාරවරයකු, මහෙස්ත්‍රාත්වරයකු හෝ වෙනත් තැනැත්තකු ඉදිරියේ දී ද, නැතහොත් ඒ සාක්ෂි ලබා ගන්නා ලද්දේ එවැනි යම් විනිශ්චයකාරවරයකු, මහෙස්ත්‍රාත්වරයකු හෝ වෙනත් තැනැත්තකු විසින් ද, ඒ විනිශ්චයකාරවරයා, මහෙස්ත්‍රාත්වරයා හෝ තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි, ඒ සාක්ෂි දක්වන, වාර්තා කරන හෝ සම්පිණ්ඩනය කර දක්වන මුල් ලේඛනය බවට හෝ ඒ ලේඛනයේ සත්‍ය පිටපතක් බවට සහතික කරනු ලැබ ඇත්නම් ඒ ලේඛනය ඒ උපවගන්තියේ කාර්ය සඳහා නිසි ලෙස සත්‍යායනය කරනු ලැබ ඇති බව සලකනු ලැබිය යුතු ය.

(3) (1) (ඇ) උපවගන්තියේ සඳහන් පරිදි සාක්ෂි වශයෙන් භාර ගන්නා ලද ලේඛනයක් බවට හෝ එසේ භාරගත් ලේඛනයක පිටපතක් බවට අදහස් කරන ලද ලේඛනයක්, ඒ ලේඛනය භාරගත් අධිකරණයේ විනිශ්චයකාරවරයකු, මහෙස්ත්‍රාත්වරයකු, හෝ නිලධරයකු විසින් එය එසේ භාරගත් ලේඛනයක් හෝ එසේ භාරගත් ලේඛනයක සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද බව අදහස් කෙරේ නම්, එය ඒ උපවගන්තියේ කාර්ය සඳහා නිසි ලෙස සත්‍යායනය කරනු ලැබ ඇති බව සලකනු ලැබිය යුතු ය.

(4) එවැනි යම් නඩු කටයුත්තක දී, ඒ සහතිකය දුන් බවට අදහස් කෙරෙන තැනැත්තාගේ අත්සන හෝ නිල තත්ත්වය ඔප්පු කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

(5) මේ වගන්තියෙන් බාහිරව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ හැකි යම් ලේඛනයක් ආවේශ්‍ය වීම සම්බන්ධයෙන් මේ වගන්තියේ කිසිවක් බල නොපෑ යුතු ය.

ශ්‍රී ලංකාව තුළ නඩු කටයුතුවල කාර්ය සඳහා සාක්ෂි ලබා ගැනීම.

**12.** (1) නිශ්චිත රටකින් ලේකම්වරයාට ලැබුණු ඉල්ලුම් පත්‍රයක් අනුව මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ අධිකරණයක කෙරෙන යම් නඩු කටයුත්තක කාර්ය සඳහා ඒ අධිකරණය විසින්, ඒ රටේ පදිංචිව සිටින තැනැත්තකුගෙන් ඒ ඉල්ලුම් පත්‍රය සම්බන්ධ කාරණාවලට අදාළව සාක්ෂි ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් නිශ්චිත රටේ උචිත බලධරයාට හෝ අධිකරණයට කරන ලෙස ලේකම්වරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ අධිකරණයක් විසින් කරන ලද ඉල්ලීමක—

(අ) ප්‍රශ්නයට අදාළ ඉල්ලුම් පත්‍රය සම්බන්ධ විස්තර ඇතුළත් විය යුතු ය ;

(ආ) සාක්ෂි ලබා ගත යුතු වන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය සඳහන් විය යුතු ය ;

(ඇ) ඒ තැනැත්තාගේ සාක්ෂි අවශ්‍ය වන්නේ කවර කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා නිශ්චිතව සඳහන් කර තිබිය යුතු ය.

නිශ්චිත රටෙහි අධිකරණයක ඉල්ලීම පිට සාක්ෂි ලබා ගැනීම.

**13.** (1) මේ පනතේ 3 වන වගන්තිය අදාළ වන ඉල්ලුම් පත්‍රයකට සම්බන්ධ කාරණා සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තකුගේ සාක්ෂි ලබාගන්නා ලෙසට නිශ්චිත රටක අධිකරණයක් විසින් හෝ වෙනුවෙන් ඉල්ලීමක් ලේකම්වරයා වෙත කර ඇති අවස්ථාවක ඒ ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කර තිබිය හැකි පරිදි එම ඉල්ලුම් පත්‍රයට සම්බන්ධ කාරණා සම්බන්ධයෙන්, ඒ තැනැත්තා පදිංචිව සිටින්නේ යම් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය ඇතුළත ද ඒ තැනැත්තාගේ සාක්ෂි ලබාගන්නා ලෙස ලේකම්වරයා විසින් එකී අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි ය.

(2) ලේකම්වරයාගෙන්, (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුණු අධිකරණයට සාක්ෂි ගැනීමේ බලය ඇති අතර, සාක්ෂි ගන්නා වේලාව හා ස්ථානය පිළිබඳව එම අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ඒ තැනැත්තාට දැන්වීමක් කිරීමෙන් පසු, ඉල්ලීමේ නම්කර ඇති තැනැත්තාගෙන් එහි නිශ්චිතව සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් සාක්ෂි ලබාගත යුතු ය. අධිකරණය විසින්, එසේ ලබාගත් සාක්ෂි (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම කරනු ලැබුවේ නිශ්චිත රටේ යම් අධිකරණයක් විසින් හෝ වෙනුවෙන් ද ඒ අධිකරණය වෙත යැවිය යුතු ය.

(3) සාක්ෂි ලබාගත යුතුව ඇති තැනැත්තා පදිංචිව සිටින්නේ යම් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය ඇතුළත ද ඒ අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස වූ සිතාසි ඒ තැනැත්තා වෙත යථා පරිදි භාරදිය නොහැකි නම්, ඒ තැනැත්තා ඒ අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශය ඇතුළත පදිංචිව නොමැති බවට සහ ඒ තැනැත්තා සිටින තැනක් නොදන්නා බවට වූ ප්‍රකාශයක් සමග ඉල්ලීම ඇතුළත් වූ ඉල්ලුම් පත්‍රය රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේකම්වරයා වෙත ආපසු යැවිය යුතු ය. එවිට, එම ඉල්ලීම හා සම්බන්ධ ලේඛන, (1) වන උපවගන්තිය යටතේ ඒ ඉල්ලීම කරන ලද්දේ නිශ්චිත රටෙහි යම් අධිකරණයක් විසින් හෝ වෙනුවෙන් ද ඒ අධිකරණය වෙත ලේකම්වරයා විසින් ආපසු යවනු ලැබිය යුතු ය.

(4) 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ තැනැත්තා නොවන යම් තැනැත්තකුට, මේ වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ අධිකරණයක් ඉදිරියේ සාක්ෂි දෙන ලෙස නියම කරනු ලැබ ඇති විටක, ඔහුගේ පැමිණීමෙහි ලා හෝ ඊට ආනුෂංගිකව නිසි ආකාරයෙන් ඔහුට සිදු වූ වියදම, වෙහෙස හෝ කාලය අපතේ යාම සම්බන්ධයෙන්, වන්දි වශයෙන් සාධාරණ ලෙස ප්‍රමාණවත් යයි අධිකරණයට පෙනී යන යම් මුදල් ප්‍රමාණ, රජය විසින් ප්‍රතිපාදනය කර ඇති මුදල්වලින් ගෙවනු ලැබිය යුතු බවට අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(5) සාක්ෂිකරුවන්ට පැමිණෙන ලෙස බලකිරීමට සහ ඒ හා සම්බන්ධ වෙනත් කරුණු සඳහා විධිවිධාන සලස්වා ඇති 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ V වන හා VI වන පරිච්ඡේදවල විධිවිධාන, ඉහත (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීම කළ අධිකරණය සම්බන්ධයෙන්, ඒ අධිකරණය විසින් විභාග කිරීම සඳහා වන පැමිණිල්ලක් වූ කලක පරිද්දෙන්, අදාළ විය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

**14.** තත් කාලයෙහි ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින තැනැත්තකුගෙන් නඩත්තු අයකර ගැනීම සඳහා නඩත්තු සම්මුතිය අදාළවන රටක උචිත බලධරයාගෙන් ඒ රටේ යම් තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක් 1958 අගෝස්තු මස 7 වන දිනට පසු එහෙත් මේ පනත සහතික කරනු ලැබූ දිනට පෙරාතුව, ලේකම්වරයා වෙත ලැබී ඇති අවස්ථාවක, ඒ රට, ලේකම්වරයා වෙත ඒ ඉල්ලීම ලැබුණු දිනට පෙරාතුව ම වූ දිනයෙහි සිට මේ පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ නිශ්චිත රටක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව නඩත්තු අයකර ගැනීමට අපේක්ෂා කරන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා පදිංචිව සිටින ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත එම ඉල්ලීම, මේ පනත යටතේ කටයුතු කරනු ලැබීම සඳහා ලේකම්වරයා විසින් යවනු ලැබිය යුතු ය.

මුස්ලිම්වරුන්ට අදාළ ඉල්ලීම් සම්බන්ධයෙන් අත්හැරීම්.

**15.** (115 වන අධිකාරය වන) මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ විධිවිධාන මගින් පාලනය වන මුස්ලිම් ජාතිකයකුට අදාළ වූ නඩත්තු සඳහා වන ඉල්ලීමක කාරණයක දී, "මහෙස්ත්‍රාත් අධිකරණය"ක් පිළිබඳව මේ පනතේ ඇති සෑම සඳහන් කිරීමක් ම, ඒ පනත යටතේ පත් කරන ලද අදාළ ක්වාසි අධිකරණය සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**17.** මේ පනතෙහි—

"නඩත්තු සම්මුතිය" යන්නෙන්, 1956 ජූනි මස 20 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද විදේශවල දී නඩත්තු අයකර ගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අදහස් වේ ;

"සහතික කළ පිටපත" යන්නෙන්, අධිකරණයක ආඥාවක් සම්බන්ධයෙන් යෙදුනු විට, අධිකරණයේ නිසි නිලධරයකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද ආඥාවේ පිටපතක් අදහස් වේ ;

"ගෙවන්නා" යන්නෙන්, ලේඛනගත ආඥාවක් සම්බන්ධයෙන් යෙදුනු විට, ආඥාව යටතේ ගෙවීම් සිදු කිරීමට යටත් තැනැත්තා අදහස් වේ ;

"ලේඛනගත කරන අධිකරණය" යන්නෙන්, ලේඛනගත ආඥාවක් සම්බන්ධයෙන් යෙදුන විට, මේ පනත යටතේ ආඥාව තත් කාලයේ ලේඛනගත කර ඇති අධිකරණය අදහස් වේ ;

"ලේඛනගත ආඥාව" යන්නෙන්, මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ අධිකරණයක තත් කාලයේ ලේඛනගත කර ඇති ආඥාවක් අදහස් වේ ; තව ද

"සම්බන්ධිත ලේඛන" යන්නෙන්—

(අ) ආඥාව කරනු ලැබුවේ යම් ඉල්ලුම් පත්‍රයක් අනුව ද එම ඉල්ලුම් පත්‍රය ;

(ආ) ගෙවන්නා සිටින ස්ථානය පිළිබඳව ඔහු සතුව ඇති තොරතුරු සඳහන් කෙරෙන ප්‍රකාශයක් ; සහ

(ඇ) නඩුව සම්බන්ධව ඔහු සතුව ඇති යම් අදාළ ලේඛන

අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.